අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/05/67/01/පොදු/V
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2022.07.07

සියළුම ජාතික පාසල් විදුහල්පතිවරුන්,
පීඨාධිපතිවරුන්,
ගුරු විදුහල්පතිවරුන් වෙත.

<u>විවිධ තනතුරුධාරීන්හට වාරාන්තර නිවාඩු ලබා දීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති පහත සඳහන් ලිපි කෙරෙහි කාරුණික අවධානය යොමු කරවමි.

I. පුස්තකාල සේවකයින්හට වාරාන්තර නිවාඩු ලබා දීම
II. රසායනාගාර සහකාර/රසායනාගාර සේවක තනතුරුධාරීන්ට වාරාන්තර නිවාඩු ලබා දීම
III. තාක්ෂණ පීය සේවකයින්හට වාරාන්තර නිවාඩු ලබා දීම

02. ඉහත සඳහන් ලිපිවලින් අපේක්ෂා කරනු ලබනුයේ වාරාන්තර නිවාඩු කාල වලදී අත්‍යාවශ්‍ය නොවන කාර්යමණ්ඩලය සේවයට කැඳවීම සීමා කිරීම වන අතර, ඇතැම් ආයතන ප්‍රධානීන් ඒ පිළිබඳව නිසි අවධානයකින් තොරව කටයුතු කරන බවට කරුණු වාර්තා වී ඇත. ඒ අනුව තනතුරට අදාල නිත්‍ය රාජකාරි නොයෙදෙන වාරාන්තර නිවාඩු කාලයන්හිදී රසායනාගාර සහකාර, සේවා සහායක පුස්තකාල, සේවා සහායක රසායනාගාර සහ සේවා සහායක තාක්ෂණ පීය යන තනතුරුධාරීන් සඳහා වාරාන්තර නිවාඩු ලබා දීම මෙයින් අනුමත කරන අතර, එම කාල සීමාවන්හිදී ඔවුන් සේවයට කැඳවීම අවශ්‍ය නොවේ.

03. කෙසේ වෙතත් වාරාන්තර නිවාඩු කාල සීමාව තුලදී සාමාන්‍ය පරිදි සිදු කරනු ලබන කටයුතු සඳහා අවශ්‍යතාවය පරිදි යම් සීමිත දින ගණනක් ඔවුන් සේවයට කැඳවීමට සහ වෙනත් විශේෂ හෝ අත්‍යාවශ්‍ය අවස්ථාවකදී ඔවුන්ගේ සේවය ලබා ගැනීමට මෙයින් බාධාවක් සිදු නොවිය යුතුය.

04. තවද, වෙනත් විශේෂ විධි විධාන නිකුත්කර නොමැත්තේ නම් වාරාන්තර නිවාඩුවලට අමතරව රජය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන වෙනත් විශේෂ නිවාඩු කාල සීමාවන් සඳහා ද මෙම විධි විධාන අදාල වන බව කාරුණිකව දන්වා සිටිමි.

අත්/කළේ - එම්.එන්.රණසිංහ
ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

ආර්.බී.ගන්කේවල
අතිරේක ලේකම් (අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා)

පිටපත්
1. සියලුම පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු
2. අදාල වෘත්තීය සමිති ලේකම්වරුන්

ගරු අමාත්‍යතුමා +94112784832
ලේකම් / செயலாளர் +94112784811 +94112785162